11 ශ්‍රේණිය

1 පාඩම- ගැටළු විසඳීමට ක්‍රමලේඛ ලිවීම

අ.පො.ස. (සා/පෙළ) 2022

- 1 සිට 3 තෙක් ප්‍රශ්නවලට පිළිතුරු සැපයීම සඳහා දී ඇති ගැලීම් සටහන සලකන්න.



1. ආදානය ලෙස 3 ලබා දුන් විට ගැලීම් සටහනේ ප්‍රතිදානය කුමක් ද?

(1) 1 (2) 3

(3) 6 (4) 24

2. මෙම ගැලීම් සටහන මත පාදක වූ පරිගණක ක්‍රමලේඛයකට ඇතුළත් කිරීමට වඩාත් සුදුසු පහත කවර ව්‍යුහයන් ද?

A – *if then*

B – *if then else*

C – *while-endwhile*

(1) A පමණි. (2) B පමණි.

(3) C පමණි. (4) B සහ C පමණි.

3. මෙම ඇල්ගොරිතමයේ N සැමවිටම ධන පූර්ණ සංඛ්‍යාවක් විය යුතු ය. ඉහත කොන්දේසිය සපුරාලීමට ගැලීම් සටහන සඳහා පහත කවරක් යෝජනා කළ හැකි ද?

(1) ගැලීම් සටහන තිබෙන ලෙසින්ම තබා ගැනීම

(2) **N= 1?** කොන්දේසිය **N= 0?** ලෙස වෙනස් කිරීම

(3) **N=1?** කොන්දේසිය **N= -1?** ලෙස වෙනස් කිරීම

(4) N ආදානය කළ විගසම එය පරීක්ෂා කොට සෘණ නම් ගැලීම අවසන් කිරීම

4. පසුගිය වසරේ එක් එක් මාසයේ බිත්තරයක සාමාන්‍ය මිල A නම් වූ අරාවේ (array) අඩංගු වේ.

A:	20	25	50	55	70	65	50	60	65	50	55	49

ඉහළම සාමාන්‍ය මිල කුමන අරා අවයවයේ අඩංගු වේ ද?

(1) A [0] (2) A [4] (3) A [10] (4) A [11]

5. පහත පැස්කල් කේතය ක්‍රියාත්මක කළ විට ප්‍රතිදානය කුමක් වේ ද?

```
Program testPrint(input, output);
Var count: integer;
Begin
      For count:=1 to 4 do
        Write(count);
End.
```

(1) 1
(2) 4
(3) 123
(4) 1234

6. පහත ව්‍යාජ කේතය 1 සිට 10 තෙක් සංඛ්‍යාවල එකතුව සොයාගැනීම සඳහා ය.

```
Begin
      sum = 1
      number = 1
      repeat
            A
            sum = sum + number
      until number < 10
      display sum
End
```

A සඳහා සුදුසු ආදේශකය කුමක් ද?

(1) number = number + 1
(2) number + 1
(3) number = 0
(4) sum = 2

7. පහත ව්‍යාජ කේතය සලකන්න.

```
Begin
      P = 0
      while P<6
            display '*'
            P = P + 3
      endwhile
End
```

එයට අනුව * කොපමණ වතාවක් මුද්‍රණය වේ ද?

(1) 1
(2) 2
(3) 3
(4) 4

8. පහත ව්‍යාජ කේත කොටස සලකන්න.

```
if weakness < 40
      if character > 70
            suitability = "Good"
      endif
endif
```

පහත කවරක් සත්‍ය වේ ද?

(1) weakness < 40 නම් suitability = "Good" වේ.
(2) character > 70 නම් suitability = "Good" වේ.
(3) weakness < 40 සහ character > 70 නම් suitability = "Good" වේ.
(4) weakness < 40 හෝ character > 70 හෝ නම් suitability = "Good" වේ.

9. පහත ප්‍රකාශ සලකන්න.

A - යන්ත්‍ර භාෂා කේතයක් 0 සහ 1 වලින් සමන්විත වේ.

B - පැස්කල් කේතයක්, එයට තුල්‍ය යන්ත්‍ර භාෂා කේතයට වඩා පහසුවෙන් තේරුම් ගත හැකි ය.

C - පැස්කල් කේතයක් එයට තුල්‍ය යන්ත්‍ර භාෂා කේතයට හැරවීමට, එය සම්පාදනය (compile) කළ යුතු ය.

ඉහත ඒවායින් නිවැරදි ප්‍රකාශය/ප්‍රකාශ කුමක් ද?

(1) A පමණි (2) A සහ B පමණි (3) A සහ C පමණි (4) A, B සහ C සියල්ලම

10. පහත සඳහන් කවර පාලන ව්‍යුහයන් (control structures) ඇල්ගොරිතමයක් තුළ දී භාවිත කළ හැකි වන්නේ ද?

A - අනුක්‍රමය (Sequence)
B - පුනර්කරණය (Repetition)
C - වරණය (Selection)

(1) A සහ B පමණි (2) A සහ C පමණි (3) B සහ C පමණි (4) A, B සහ C සියල්ලම

- 2 සහ 3 ප්‍රශ්නවලට පිළිතුරු සැපයීම සඳහා දී ඇති ගැලීම් සටහන සලකා බලන්න.



11. දී ඇති ගැලීම් සටහන් එහි ප්‍රතිදානය ලෙස කුමක් දිස් වේ ද?

(1) 1 දිස් වේ.
(2) 3 දිස් වේ.
(3) 15 දිස් වේ.
(4) කිසිවක් දිස් නොවේ.

12. දී ඇති ගැලීම් සටහනනෙහි පෙනවා ඇති ‘ඔව්’ සහ ‘නැත’ යන ලේබල අතුරු මාරු (interchange) කළේ නම් එහි ප්‍රතිදානය වන්නේ කුමක් ද?

(1) 1 දිස් වේ.
(2) 3 දිස් වේ.
(3) 15 දිස් වේ.
(4) කිසිවක් දිස් නොවේ.

13. පහත දක්වා ඇති කේත කොටසෙහි “count = count – 3” යන වගන්තිය කොපමණ වාරයක් ක්‍රියාත්මක වේ ද?

```
count = 2
WHILE count >= 3
        Count = count – 3
END WHILE
```

(1) 3 (2) 4 (3) 5 (4) 6

- 14 සහ 15 ප්‍රශ්න සඳහා පිළිතුරු සැපයීමට, පොත් 8 ක මිල ආචයනය කිරීම සඳහා භාවිත කරන, පහත පෙන්වා ඇති “පොත්” අරාව (“Books” Array) සලකා බලන්න.

Books:

96	75	105	200	54	100	63	80

14. පැස්කල් (Pascal) ක්‍රමලේඛයේදී, “Books” අරාව නිවැරදිව අර්ථ දක්වා ඇත්තේ පහත සඳහන් කවරකින් ද?

(1) var Books = array[7]; (2) var Books : array[0-7];

(3) var Books : array[0..7] of integer; (4) var Books : array[0 to 7] of integer;

15. වඩාත්ම මිල අධික පොත නිරූපණය වන්නේ පහත සඳහන් කුමකින් ද?

(1) Book[3] (2) Books[3] (3) Book[4] (4) Books[4]

අ.පො.ස. (සා/පෙළ) 2020

16. ක්‍රමලේඛ භාෂා සම්බන්ධයෙන් පහත සඳහන් කුමන වගන්ති නිවැරදි වන්නේ ද?

A- පැස්කල් හා C යනු ඉහළ මට්ටමේ ක්‍රමලේඛ භාෂා සඳහා උදාහරණ වේ.
B- යන්ත්‍ර භාෂාවෙන් ලියන ලද ක්‍රමලේඛයක් පරිගණකයට කෙළින්ම ක්‍රියාත්මක කළ හැකිය.
C- ඇසෙම්බ්ලි භාෂාවෙන් ලියන ලද ක්‍රමලේඛවල ක්‍රියාත්මක වීමේ වේගය සංසන්දනාත්මකව යන්ත්‍ර භාෂාවෙන් ලියැවුණු ක්‍රමලේඛවල ක්‍රියාත්මකවීමේ වේගයට වඩා වැඩි වේ.

(1) A හා B පමණි. (2) A හා C පමණි. (3) B හා C පමණි. (4) A, B හා C සියල්ලම

17. පහත දක්වා ඇති ව්‍යාජ කේතයේ ප්‍රතිදානය කුමක් ද?

```
BEGIN
        Sum = o
        Count = 5
        REPEAT
                Sum = sum + count * count
                count = count - 1
        UNTIL count > 0
        DISPLAY sum
END
```

(1) 25 (2) 41 (3) 50 (4) 55

18. පැස්කල් භාෂාවේ දී පහත පෙන්වා ඇති M අරාව සලකා බලන්න.

M =	10	20	30	40	50	60	70	80

A- M අරාවේ දිග 8 කි.
B- M[5] හි අගය 50 වේ.
C- M[1] + M[3] හි අගය 60 වේ.

ඉහත වගන්ති අතුරෙන් කවරක් නිවැරදි වන්නේ ද?

(1) A හා B පමණි. (2) A හා C පමණි. (3) B හා C පමණි. (4) A, B හා C සියල්ලම

19. num සඳහා ආදානය ලෙස 5 දී ඇත්නම්, පෙන්වා ඇති ගැලීම් සටහනෙහි ප්‍රතිදානය විය හැක්කේ කුමක්ද?



(1) 120

(2) 60

(3) 24

(4) 5

20. පහත දක්වා ඇති ව්‍යාජ කේතයේ ප්‍රතිදානය කුමක්ද?

```
BEGIN
    number = 12
    WHILE number > 5
        IF (number >= 10)
            number = number /2
        ELSE
            number = number + 4
    ENDWHILE
    DISPLAY number
END
```

(1) 5 (2) 6 (3) 10 (4) 16

අ.පො.ස. (සා/පෙළ) 2019

21. පහත සඳහන් වගන්ති අතුරෙන් සත්‍ය වන්නේ කවරක්ද?

A- Pascal යනු ඉහළ මට්ටමේ ක්‍රමලේඛ භාෂාවක් සඳහා උදාහරණයකි.

B- පහළ මට්ටමේ භාෂා ක්‍රමලේඛවලට වඩා ඉහළ මට්ටමේ භාෂා ක්‍රමලේඛ තේරුම් ගැනීම ක්‍රමලේඛකයින්ට පහසු වේ.

D- සම්පාදකයක් (compiler) මගින් ඉහළ මට්ටමේ භාෂා ක්‍රමලේඛයක් , යන්ත්‍රභාෂා (machine language) උපදෙස් බවට පරිවර්තනය කරනු ලැබේ.

(1) A හා B පමණි (2) A හා C පමණි (3) B හා C පමණි (4) A, B හා C සියල්ලම

22. පහත දක්වා ඇති ව්‍යාජ කේත කොටස (pseudo code) සලකන්න.

```
BEGIN
    READ units
    IF units < =50 THEN
        amount = units*1
    ELSE
        IF units > 50 AND units <= 150 THEN
            amount = 50 + (units - 50)*2
        ELSE
            amount = 250 + (units - 150)*5
        ENDIF
    ENDIF
    DISPLAY amount
END
```

Units යන විචල්‍ය සඳහා 175 ආදානය කළහොත් ප්‍රතිදානය වන්නේ කුමක් ද?

(1) 175 (2) 250 (3) 300 (4) 375

23. පහත සඳහන් ව්‍යාජ කේත කොටස සඳහා පරිශීලකයෙකු 4, 5, 2, -1 යන සංඛ්‍යා එකකට පසු අනෙක ආදානය කළේ නම් එහි ප්‍රතිදානය වන්නේ කුමක්ද?

```
terminal= -1
x=0
REPEAT
          DISPLAY "Enter number"
          GET num
                IF num > x THEN
                      x = num
                END IF
    UNTIL num= terminal
    DISPLAY x
```

(1) -1 (2) 0 (3) 4 (4) 5

24. පරිගණක ක්‍රමලේඛ සම්බන්ධයෙන් පහත දී ඇති වගන්ති සලකා බලන්න.

A - විචල්‍යයන්ට (*variables*) විවිධ අවස්ථාවන්හිදී විවිධ අගයන් ගත හැකි ය.

B - පරිගණක භාෂාවක වෙන් කරන ලද වදන් (*reserved words*) එම ක්‍රමලේඛ භාෂාවේම විචල්‍ය නාම සේ භාවිතා කළ හැකි ය.

ඉහත වගන්ති සම්බන්ධයෙන් පහත සඳහන් කවරක් සත්‍ය වන්නේ ද?

(1) A පමණක් නිවැරදිය. (2) B පමණක් නිවැරදිය.

(3) A හා B දෙකම නිවැරදිය. (4) A හා B දෙකම වැරදිය.

25. පහත පෙන්වා ඇති ව්‍යාජ කේතය සලකා බලන්න.

```
READ a, b, c
value = 0
IF (a>b) THEN
      IF (a>c) THEN
            value =a
      ELSE
            value =c
      END IF
ENDIF
DISPLAY value
```

a, b හා c යන විචල්‍ය සඳහා පිළිවෙලින් 50, 30 හා 70 යන අගයන් ආදානය කරනු ලබයි නම්, දර්ශනය කෙරෙන ප්‍රතිදානය කුමක් ද?

(1) 0 (2) 30 (3) 50 (4) 70

26. පහත දැක්වෙන ව්‍යාජ කේත (pseudo code) කොටස සලකන්න.

```
Payment_option = 'False'
IF distance > 100 THEN
        Payment_option = 'True'
        IF vehicle_ type = 'Bus' THEN
                Payment_option= 'False'
        END IF
END IF
```

ඉහත ව්‍යාජ කේතයට අනුව පහත සඳහන් කුමන වගන්තිය නිවැරදි වන්නේ ද?

(1) distance = 99 හා vehicle_type = 'Car' වන විට Payment_option = 'True' ලෙස වේ.
(2) distance = 99 හා vehicle_type = 'Bus' වන විට Payment_option = 'True' ලෙස වේ.
(3) distance = 101 හා vehicle_type = 'Bus' වන විට Payment_option = 'False' ලෙස වේ.
(4) distance = 99 හා vehicle_type = 'Car' වන විට Payment_option = 'False' ලෙස වේ.

27. පහත පෙන්වා ඇති A නම් අරාව (array) මගින් සිසුන් 10 දෙනෙකු ICT විෂය සඳහා ලබා ගත් ලකුණු දක්වනු ලැබේ. මෙම අරාවේ බින්දුවෙන් (0) ආරම්භ වන සුචිකරණයක් (indexing) පවතී.

A:	76	49	54	88	61	68	72	93	37	70

ඉහළම ලකුණ ලබාගත හැක්කේ පහත සඳහන් කුමන සුචිගත (indexed) අවයවය භාවිතයෙන් ද?

(1) A [0]   (2) A [1]   (3) A [7]   (4) A [9]

28. පහත ව්‍යාජ කේතය ක්‍රියාත්මක කළවිට $ ලකුණ කී වාරයක් දිස්වේ ද?

```
BEGIN
        P = 0
        REPEAT
                Q = P MOD 2
                IF Q = 1 THEN
                        DISPLAY '$'
                ENDIF
                P = P + 1
        UNTIL P < 5
END
```

(1) 0   (2) 1   (3) 2   (4) 3

29. දී ඇති ගැලීම් සටහන සලකන්න. එය ආදානය කරනු ලබන සංඛ්‍යාව 0 සහ 100 අතර වන්නේ නම් 'වලංගු ලකුණකි' යන්න පෙන්වයි.

P , Q හා R ලේබල සඳහා ලිවිය යුතු පද පිළිවෙළින් දැක්වෙන පිළිතුර තෝරන්න.



(1) N<= 100, නැත, ඔව්

(2) N<= 100, ඔව්, නැත

(3) N= 100, නැත, ඔව්

(4) N= 100, ඔව්, නැත

30. දී ඇති ගැලීම් සටහනේ තර්කනය හා තුල්‍යවන ව්‍යාජ කේතය (pseudo code) කුමක් ද?



(1)
```
BEGIN
        READ C
        F=9*C
        F=F+32
        F=5*F
        SHOW F
END
```

(2)
```
BEGIN
        READ C
3F= 9*C/5+32
        SHOW F
END
```

(3)
```
BEGIN
    READ C
    F= 9*C/5+32
    SHOW F
END
```

(4)
```
BEGIN
        READ C
F=9*C
        F=C+32
        F=5*C
        SHOW F
END
```

31. ක්‍රමලේඛ භාෂා සම්බන්ධයෙන් පහත සඳහන් වගන්ති අතුරෙන් නිවැරදි වගන්ති/ වගන්තිය මොනවා ද?

A - යන්ත්‍ර භාෂාවල භාවිත කරන්නේ පරිගණකයකට තේරුම් ගත හැකි ද්විමය සංඛ්‍යාංක බිටු [binary digits (bits)] පාදක උපදෙස් ය.

B - යන්ත්‍ර කේතයෙහි (machine code) සංකේතාත්මක නිරූපණයන් භාවිත කරන එසෙම්බ්ලි භාෂාව (Assembly language) යන්ත්‍රය මත රඳා පවතින පහළ මට්ටමේ භාෂාවකි.

C - උසස් මට්ටමේ භාෂාවන් (high level programming languages) යන්ත්‍රයෙන් ස්වායත්ත වේ.

(1) A පමණි (2) A හා C පමණි (3) B හා C පමණි (4) A, B හා C සියල්ල ම

32. ගැලීම් සටහනක් භාවිතයෙන් විස්තර කර ඇති පහත දැක්වෙන ඇල්ගොරිතමය සලකන්න:



ගැලීම් සටහනෙහි ආදාන (inputs) ලෙස X = 10 හා Y = 20 ලබා දුන්නේ නම්, අනුපිළිවෙලින් X හා Y සඳහා දර්ශනය කරනු (display) ලබන අගයන් මොනවා ද?

(1) 10, 10 (2) 10, 20

(3) 20, 10 (4) 20,20

33. 1 සිට 10 තෙක් වූ සංඛ්‍යාවල (numbers) ගුණිතය (products) ලබා ගැනීම සඳහා P ලේබලය ඇතුළත් පහත ව්‍යාජ කේතය (pseudo code) සලකන්න.

```
product = 1
number = 0
repeat
        number = number + 1
        product = product * number
until P
```

P ලේබලය සඳහා නිවැරදි ප්‍රකාශනය කුමක්ද?

(1) *number > 10* (2) *number < 10* (3) *number >= 10* (4) *number <= 10*

34.පෙන්වා ඇති ගැලීම් සටහනෙහි ඇති ඇල්ගොරිතමයේ තර්කනය හා තුල්‍ය වන්නේ කුමන ව්‍යාජ කේත කොටසටද?



(1)
```
N=1
 while N<=10
   N= N+1
   display N
 end while
```

(2)
```
for N=0 to 10 do
   display N
```

(3)
```
N=0
 while N<=10
   display N
   N= N+1
 end while
```

(4)
```
for N=1 to 10 do
   display N
```

35. පහත සඳහන් ව්‍යාජ කේතය සලකන්න:

```
X=0
do
        display '*'
        X=X+2
while X<5
```

ඉහත ව්‍යාජ කේතයෙහි ප්‍රතිදානය ලෙස '*' කොපමණ වාර සංඛ්‍යාවක් දර්ශනය වේද?

(1) 2 (2) 3 (3) 4 (4) 5

36. පහත සඳහන් ව්‍යාජ කේතය සලකන්න:

```
if average >70 then
    if Sport_colour = 'True' then
        Allrounder_award = 'True'
    end if
end if
```

ඉහත දක්වා ඇති ව්‍යාජ කේතයේ තර්කයට පහත සඳහන් කවරක් තුල්‍ය වේ ද?

(1) average > 70 AND Sport_colour = 'True' නම්, එවිට Allrounder_award= 'True' වේ.

(2) average > 70 OR Sport_colour= 'True' නම්, එවිට Allrounder_award= 'True' වේ.

(3) average > 70 නම්, එවිට Allrounder_award = 'True' වේ.

(4) Sport_colour = 'True' නම්, එවිට Allrounder_award = 'True' වේ.

අ.පො.ස. (සා/පෙළ) 2016

37. පහත දැක්වෙන පැස්කල් ක්‍රමලේඛය සලකන්න:

```
Program repetition (input, output);
    var X: integer;
    begin
        X:= 1;
        repeat
            write (X) ;
            X := X+ 1;
        until X = 3 ;
    end.
```

ඉහත ක්‍රමලේඛය ක්‍රියාත්මක වූ පසු ලබා දෙන ප්‍රතිදානය කුමක් ද?

(1) 1
2 (2) 1 2 (3) 1
2
3 (4) 1 2 3

38. 1 සිට 100 දක්වා වන සංඛ්‍යාවල එකතුව ගණනය කිරීම සඳහා වූ X ලේබලය සහිත පහත දැක්වෙන ව්‍යාජ කේතය සලකා බලන්න:

```
sum = 0
num = 0
repeat
    num = num + 1
    sum = sum + num
until X
```

ඉහත දැක්වෙන ව්‍යාජ කේතයේ X ලේබලය සඳහා ගැළපෙන නිවැරදි පාලකය (condition) කුමක් ද ?

(1) *num < 100* (2) *num < =100* (3) *num >100* (4) *num >= 100*

අංක 39 සහ 40 ප්‍රශ්න සඳහා, ඕනෑම සංඛ්‍යා දහයක් අතුරෙන් කුඩාම සංඛ්‍යාව සෙවීම සඳහා සැලසුම් කරන ලද පහත ගැලීම් සටහන සලකන්න.



39. පහත දැක්වෙන කවරකින් ගැලීම් සටහනෙහි ඇති (P) හා (Q) ලේබල නිවැරදි පිළිවෙළින් නිරූපණය වේ ද?

(1) output Min, Min = N

(2) output N, count = count - 1

(3) output count, Min = N

(4) output Min, count= count – 1

40. ගැලීම් සටහනෙහි දී ඇති පාලන ව්‍යුහවලට අදාළ ව පහත කුමන ප්‍රකාශය නිවැරදි වේ ද?

(1) පුනර්කරණය (Repetition) තුළ වරණය (Selection) පැවතීම

(2) වරණය තුළ පුනර්කරණය පැවතීම

(3) පුනර්කරණය තුළ පුනර්කරණය පැවතීම

(4) වරණය තුළ වරණය පැවතීම

41. පහත දැක්වෙන ව්‍යාජ කේත ඛණ්ඩය සලකන්න:

```
count = 0
repeat
        display ("HELLO")
        count = count +1
until count > 4
while count > 4
        display ("HELLO")
        count = count -1
end while
```

ඉහත ව්‍යාජ කේතය ක්‍රියාත්මක වූ විට HELLO යන වචනය කොපමණ වාර ගණනක් දිස් වේද?

(1) 4 (2) 5 (3) 6 (4) 7

42. පසුගිය පස් වසර තුළ වාර්තා වූ ඩෙංගු රෝගීන් සංඛ්‍යාව පෙන්වීමට ප්‍රස්තාරයක් නිර්මාණය කිරීම සඳහා නිමල් පරිගණක ක්‍රමලේඛයක් ලියයි. ක්‍රමලේඛයට අදාළ ආදාන, ක්‍රියාවලිය (Process) සහ ප්‍රතිදාන පහත A සිට D දක්වා වන අනුපිළිවෙළකට **නොවන** පියවර මගින් දී ඇත.

A - පසුගිය පස් වසර තුළ වාර්තා වූ මුළු ඩෙංගු රෝගීන් සංඛ්‍යාව දැක්වෙන ප්‍රස්තාරය ප්‍රදර්ශනය කරන්න.
B - එක් එක් වසර තුළ වාර්තා වූ ඩෙංගු රෝගීන් සංඛ්‍යාව
C - මෙම වසර
D - පසුගිය පස් වසර සඳහා වාර්තා වූ මුළු ඩෙංගු රෝගීන් සංඛ්‍යාව ගණනය කරන්න.

පහත කුමක් ආදාන, ක්‍රියාවලිය සහ ප්‍රතිදාන නිවැරදි ව පෙන්වයි ද?

(1) ආදාන : A සහ B ක්‍රියාවලිය : C ප්‍රතිදානය : D
(2) ආදාන : B සහ C ක්‍රියාවලිය : D ප්‍රතිදානය : A
(3) ආදාන : B ක්‍රියාවලිය : C සහ D ප්‍රතිදානය : A
(4) ආදාන : B සහ D ක්‍රියාවලිය : A ප්‍රතිදානය : C

පිළිතුරු

(1) 3	(2) 3	(3) 4	(4) 2	(5) 4	(6) All	(7) 2
(8) 3	(9) 4	(10) 4	(11) 2	(12) 1	(13) 2	(14) 3
(15) 2	(16) 1	(17) 1	(18) 2	(19) 1	(20) 1	(21) 4
(22) 4	(23) 4	(24) 1	(25) 4	(26) 3	(27) 3	(28) 1
(29) 2	(30) 3	(31) 4	(32) 3	(33) 3	(34) 4	(35) 2
(36) 1	(37) 2	(38) 4	(39) 1	(40) 1	(41) 3	(42) 2